# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 57 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 13/01/2024<br>පැය 0820 |

**මාධ්‍ය නිවේදනය**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මීගොඩ පොලිස් ස්ථානය.**

2024.01.12 වන දින උදෑසන කාලයේදී මීගොඩ පොලිස් වසමේ පැළැදගොඩ ප්‍රදේශයෙදි මීගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 200 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 25 ක් වන රනාල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසම.**

2024.01.12 වන දින සවස් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ඔරුගොඩවත්ත හන්දිය අසන්නයෙදි දෙමටගොඩ හන්දිය දෙස සිට කැළණි පාලම දෙසට ධාවනය වූ කාර් රථයක මාර්ගය හරහා ගමන් කල පදිකයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 52 ක් වන ඔරුගොඩවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - මරදන්කේනි පොලිස් වසම.

2024.01.12 වන දින රාත්‍රී කාලයේ මරදන්කේනි පොලිස් වසමේ වෙත්තිලකේනි ප්‍රදේශයෙදි කඩෛයිකාඩු දෙස සිට මරදන්කේණි දෙසට ධාවනය වූ ට්‍රැක්ටර් රථයක ප්‍රතිවිරුද්ධ දෙසින් ධාවනය වූ යතුරුපැදියක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු මරදන්කේනි රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 33 ක් වන මුල්ලියාන්, යාපනය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මරදන්කේනි රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මරදන්කේනි පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.